ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 - 11 - 12

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | 01 | අයි.කේ.එස්. කරුණානායක මයා.<br>159/A/01, කොතලාවල.<br>බණ්ඩාරගම. |
| | 02 | ඩබ්.ඩී.ටී. අයේෂා මිය.<br>පහල කරන්නාගොඩ.<br>නෑබොඩ. |
| | 03 | යූ.එල්. දර්ශනී චතුරිකා මිය.<br>260 සී 2. 1 පටුමග.<br>බද්දෙගොඩ.<br>බණ්ඩාරගම. |
| වගඋත්තර පාර්ශවය | 01 | විදුහල්පති.<br>රාජකීය විද්‍යාලය.<br>හොරණ. |
| | 02 | අධ්‍යක්ෂ (ජාතික පාසල්).<br>අධ්‍යාපන අමාත්‍යාංශය.<br>ඉසුරුපාය.<br>බත්තරමුල්ල. |
| | 03 | ලේකම්.<br>අධ්‍යාපන අමාත්‍යාංශය.<br>ඉසුරුපාය.<br>බත්තරමුල්ල. |



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
විද්‍යුත් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පැමිණිලි අංකය : එච්ආර්සී/3084/18**

## පැමිණිල්ලේ කරුණු දැක්වීම

ඉහත පැමිණිලිකරුවන් විසින් 2018-12-12 දාතමින් ඉදිරිපත් කර ඇති සිය මුල් පැමිණිල්ල සහ එම පැමිණිලි වලට අදාලව පසුව ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු දැක්වීම් මගින් ප්‍රකාශ කර ඇත්තේ සිය දරුවන් 2019 වසරේ හොරණ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සදහා ආදි ශිෂ්‍ය ගණය යටතේ අයදුම්පත් යොමු කල බවත්, ඒ සම්බන්ධයෙන් පසුව පැවති සම්මුඛ පරික්ෂණ වලදී තමන් ඉදිරිපත් කරන ලද නිවැරදි ලේඛන සදහා එම සම්මුඛ පරික්ෂණ මණ්ඩලය විසින් පිළිවෙලින් යූ.එල්. දර්ශනි චතුරිකා යන අය (පිපි 21) මුළු ලකුණු 58 ක් ලබා තිබූ බවත්, තිලිණි අයේෂා යන අය මුළු ලකුණු 57.5 ක් ලබා ගෙන ඇති බවත් අයි.කේ.එස්. කරුණානායක යන අය මුළු ලකුණු 57.5 ක් ලබා ඇති බවත් මෙම වසරේ හොරණ රාජකීය විදුහලේ පළමු ශ්‍රේණියට දරුවන් ඇතුලත් කර ගැනීමේදී ආදි ශිෂ්‍ය ගණය යටතේ කඩඉම් ලකුණ වී ඇත්තේ ලකුණු 58 බවත් ප්‍රකාශ වී ඇත. මෙම ලකුණු ප්‍රමාණයන් ලබා ගෙන තාවකාලික ලේඛනයේ රැදී සිටි තමන් අභියාචනා විරෝධතා පරික්ෂාවෙන් පසුව චක්‍රලේඛයට පටහැනිව එහි සභාපති ඇතුළු සාමාජිකයින් කටයුතු කිරීම හේතුවෙන් පාසලට ඇතුලත් කර ගන්නා ස්ථිර ලේඛනයෙන් ඉවත් වී පොරොත්තු ලේඛනයට ඇතුලත් වීමට සිදුව තිබූ බව ප්‍රකාශ කර ඇත.

තවද මෙහිදී පැමිණිලිකරුවන් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ තාවකාලික පොරොත්තු ලේඛනයේ සිටි අයදුම්කරුවන් කිහිප දෙනෙකුට 24/2018 චක්‍රලේඛයට පටහැනිව කටයුතු කරමින් තමන්ට අගතියක් සිදුවන ආකාරයට අභියාචනා මණ්ඩල සභාපතිනිය කටයුතු කිරීම හේතුවෙන් තම දරුවන් එම වසරේ හොරණ රාජකීය විදුහලේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීමට තිබූ අවස්ථාව අහිමි වීම මගින් තම මූලික අයිතිවාසිකම් කඩවී ඇති බව ප්‍රකාශ කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර තම දරුවන් එම පාසලේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සදහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා ඇත.

### වගඋත්තරකාර පාර්ශවයන්ගේ කරුණු දැක්වීම

### විදුහල්පතිනි, හොරන රාජකීය විද්‍යාලය ආර්.ඒ.ඩී.ටී. රූපසිංහ මියගේ කරුණු දැක්වීම

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී ඉහත විදුහල්පතිනිය පරික්ෂණ අවස්ථාවකට සහභාගි වෙමින් ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරුවන් ප්‍රකාශ කර ඇති ආකාරයට තමන් ඇතුළු සම්මුඛ පරික්ෂණ මණ්ඩලය අදාල සම්මුඛ පරික්ෂණ වලදී ඉහත චක්‍රලේඛයට අනුව කටයුතු කරමින් අයදුම්කරුවන් වෙත ලකුණු පිරිනැමීම සිදු කර ඇති අතර එම ලකුණු සංශෝධනය සිදු කර ඇත්තේ අභියාචනා විරෝධතා මණ්ඩලයේ සභාපති ඇතුළු සාමාජිකයින් විසින් බැවින් සහ ඔවුන්ට ඒ සදහා චක්‍රලේඛය මගින් බලය ලබාදී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් එහි සභාපති කැඳවා විමසීමක් සිදු කිරීම වඩා යෝග්‍ය බවයි.

### අභියාචනා විරෝධතා මණ්ඩල සභාපති වසන්තා කුලසේකර මියගේ කරුණු දැක්වීම

මෙම පැමිණිලි වලට අදාලව පැවති වැඩිදුර විමර්ශනයේදී ඉහත අභියාචනා විරෝධතා මණ්ඩල සභාපති ලෙස කටයුතු කර ඇති මතුගම සී.ඩබ්.ඩබ්. කන්නංගර ජාතික පාසලේ විදුහල්පතිනිය ලෙස කටයුතු කර ඇති වසන්තා කුලසේකර මිය සිතාසි මගින් කොමිෂන් සභාව වෙත කැඳවා ඇති බව නිරීක්ෂණය වන අතර, 2019-12-06 දින කැඳවා තිබූ පරික්ෂණයට සහභාගි වෙමින් කුලසේකර මිය ප්‍රකාශ කර ඇත්තේ තමන් එහිදී කටයුතු කර ඇත්තේ චක්‍රලේඛයට අනුකූලව බවත්, පැමිණිල්ලේ ප්‍රශ්නගත අයදුම්කරුවන් සදහා ලකුණු පිරිනැමීමේදී තමන් අභියාචනා විරෝධතා මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ගේ එකගතාවය මත මෙම ලකුණු ලබාදීම් සිදු කර ඇති බවයි. ඒ අනුව

තමන් 24/18 චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව කටයුතු කර නොමැති බව එම පරීක්ෂණයේදී ඇය වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම්/ අධ්‍යක්ෂ (ජාතික පාසල්) කරුණු දැක්වීම**

මෙම පැමිණිලි සම්බන්ධයෙන් වන පරීක්ෂණ සඳහා ඉහත වගඋත්තරකරුවන් කැඳවා ඇති අතර එම නිලධාරීන් වෙනුවෙන් නියෝජිතයින් පරීක්ෂණ අවස්ථා කිහිපයකට සහභාගී වී ඇති බව නිරීක්ෂණය වන අතර එහිදී එම නියෝජිතයින් ප්‍රකාශ කර ඇත්තේ චක්‍රලේඛය ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සභාපති ඇතුළු සාමාජිකයින් සහ අභියාචනා විරෝධතා මණ්ඩල සභාපති ඇතුළු සාමාජිකයින් වෙත අදාල චක්‍රලේඛය මගින්ම එම වසරේ රජයේ පාසල් වලට දරුවන් ඇතුළත් කර ගැනීමට අදාල සම්මුඛ පරීක්ෂණ සහ අභියාචනා විරෝධතා පරීක්ෂා කිරීම් සම්බන්ධ අවශ්‍ය සියලු බලතල ලබාදී ඇති බැවින් ඔවුන් ඒ අනුව කටයුතු කළ යුතු බවයි.

**හොරණ රාජකීය විද්‍යාලයේ නව විදුහල්පති වී.ආර්.පී. කුමාර මහතාගේ කරුණු දැක්වීම**

කොමිෂන් සභාවේ දැන්වීම පරිදි හොරණ රාජකීය විද්‍යාලයේ නව විදුහල්පතිවරයා විසින් මෙම පැමිණිල්ලට අදාලව 2021-06-01 දාතමින් ලිඛිත කරුණු දැක්වීමක් ඉදිරිපත් කර ඇති අතර එහිදී නව විදුහල්පතිවරයා ප්‍රකාශ කර ඇත්තේ මෙම පැමිණිල්ලේ ප්‍රශ්නගත කාරණය සම්බන්ධව තමා විසින් අදාල සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ලේඛන සහ අභියාචනා විරෝධතා මණ්ඩලය විසින් පරිහරනය කරන ලද සියලුම ලේඛන පිළිබඳව සොයා බැලූ බවත් එහිදී තමන් වෙත අනාවරණය වී ඇති කරුණු අනුව 2019 වසර සඳහා හොරණ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීමට අදාලව කටයුතු කර ඇති ඉහත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා විරෝධතා මණ්ඩල සාමාජිකයින් 24/2018 චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව කටයුතු කර ඇති බව තමාට නිරීක්ෂණය වී ඇති බවත් ඒ අනුව මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුවන් අතුරින් අදාල පොරොත්තු ලේඛනයේ ඉදිරියෙන්ම සිටින අයදුම්කරුවන් දෙදෙනා වන යූ.එල්. දර්ශනී චතුරිකා (පිපි 21) යන අයගේ පුත්‍රයා වන එච්.යූ. ඔමෙත් චන්දුක දරුවා සහ අයි.කේ.එස්. කරුණානායක යන අයගේ දියණිය වන දෙනෙති අමායා කරුණානායක දැරිය හොරණ රාජකීය විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යංශය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් තමාගේ විරෝධයක් නොමැති බව දක්වා ඇත.

**කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු**

මෙම පැමිණිල්ලට අදාල වැඩිදුර විමර්ශනය සඳහා 2021-03-26 වන දින පාර්ශවකරුවන් කැඳවා ඇති අතර පැමිණිලිකරුවන් තිදෙනාම ඊට සහභාගී වී ඇති අතර හොරණ රාජකීය විද්‍යාලයේ වත්මන් විදුහල්පති වී.ආර්.පී. කුමාර මහතා පමණක් වගඋත්තරකරුවන් අතුරින් ඊට සහභාගී වී ඇත. එහිදී පරීක්ෂණ නිලධාරී වත්මන් විදුහල්පතිවරයා වෙත දන්වා ඇත්තේ මෙම පැමිණිලිකරුවන්ගේ දරුවන් හොරණ රාජකීය විදුහලේ 3 වන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සමග සාකච්ඡා කර අවශ්‍ය මැදිහත්වීම සිදු කරන ලෙසත් මෙම පැමිණිල්ලේ විෂයගත කාරණය සම්බන්ධයෙන් පාසලේ පවතින ලේඛන පරීක්ෂා කර කොමිෂන් සභාව වෙත විධිමත් ලිඛිත කරුණු දැක්වීමක් කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසයි. විශේෂයෙන්ම පැමිණිලිකරුවන් ප්‍රකාශ කර ඇති ආකාරයට පිපි 112 යටතේ ඉදිරිපත්ව ඇති රුවනි නිසංසලා ද සිල්වා යන අයගේ දරුවා පිපි 99 යටතේ අයදුම් කර ඇති උදානි ලක්ෂිකා ප්‍රනාන්දු යන අයගේ දරුවා සහ පිපි 86 යටතේ අයදුම් කර ඇති චතුරිකා දර්ශනී යන අයගේ දියණිය යන දරුවන් වෙත අභියාචනා විරෝධතා මණ්ඩලයේදී ලකුණු පිරිනමා ඇති ආකාරය පැමිණිලි පාර්ශවය ප්‍රශ්නගත බව ප්‍රකාශ කරන බැවින් ඉහත ලිඛිත කරුණු දැක්වීමේදී ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන ලෙසයි.

01 වන වගඋත්තරකාර පාර්ශවය විසින් 2021-06-01 දාතමින් විධිමත් ලිඛිත කරුණු දැක්වීමක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර 2019 වර්ෂයේ පළමු ශ්‍රේණිය සඳහා හොරණ රාජකීය විද්‍යාලයට දරුවන් ඇතුළත් කර ගැනීමේදී අදාල සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සහ අභියාචනා විරෝධතා මණ්ඩලයේ ලේකම්වරුන්ගේ ලිඛිත ප්‍රකාශ ද සැලකිල්ලට ගෙන මෙම කරුණු දැක්වීම ඉදිරිපත් කර ඇත. ඒ අනුව පීපී 112 යටතේ අයදුම් කර ඇති ඒ.ඩබ්.ආර්.ඒ. ද සිල්වා යන අය වෙත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී ලබාදී ඇති ලකුණු 57 ට අමතරව අභියාචනා මණ්ඩලය විසින් තවත් ලකුණු 3 ක් එකතු කර මුළු ලකුණු 60 දක්වා වැඩි කර ඇති බවත්. පසුව එයින් ලකුණු 2 ක් අඩු කර මුළු ලකුණු 58 හි ස්ථාන ගත කර ඇති බව පවසයි. එහිදී වැඩිවූ ලකුණු ප්‍රදානය කර ඇත්තේ විෂය සමගාමී කටයුතු යටතේ වෙන් කර ඇති ලකුණු 25 තුළින් සෞන්දර්ය කටයුතු සඳහා වෙන් කර ඇති ලකුණු 6 ට එකක් එකතු කර ලකුණු 7 ක් ලෙසට බවත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නිර්නායක අනුව සෞන්දර්ය කටයුතු සඳහා වන උපරිම ලකුණු 6 සීමාව ඉක්මවා මෙහිදී එක් ලකුණක් පිරිනමා ඇති බව නිරීක්ෂණය වී ඇති බව දක්වා ඇත.

අංක පීපී 99 යටතේ අයදුම් කර ඇති උදානි ලක්ෂිකා ප්‍රනාන්දු යන අය වෙත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් පිරිනමා ඇති ලකුණු 57 ට අමතරව අභියාචනා මණ්ඩලය විසින් තවත් එක් ලකුණක් පිරිනමා මුළු ලකුණු 58 දක්වා වැඩි කර ඇති අතර එහිදී එම ලකුණ ප්‍රදානය කර ඇත්තේ පාසල් මට්ටමින් සිංහල භාෂා දින තරග සහතිකයක් සඳහා බවත්. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේකම් ප්‍රකාශ කර ඇති පරිදි සම්මුඛ පරීක්ෂණයේදී ඒ සඳහා ලකුණක් පිරිනමා තිබියදී ඒ සඳහා නැවත ලකුණක් ලබාදී ඇති බවත් ඒ අනුව එකම සහතිකය සඳහා අවස්ථා දෙකකදී ලකුණු ලබාදී ඇති බව පෙන්වා දී ඇත. මේ ආකාරයට එම අයදුම්කරුවන් දෙදෙනාගේ ලකුණු ප්‍රමාණය වැඩිවීම සමග තාවකාලික ලේඛනයේ පොරොත්තු ලැයිස්තුවේ සිටි ඔවුන් අවසාන ලේඛනයේ තෝරා ගත් ලැයිස්තුව වෙත ඇතුළත් වී ඇති බව ප්‍රකාශ කර ඇත.

එසේම පීපී 86 අංකය යටතේ අයදුම් කර ඇති එච්.ටී. චතුරිකා දර්ශනී යන අය වෙත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේදී ලබාදී ඇති ලකුණු 57 ට අමතරව තවත් ලකුණු 2 ක් එකතු කර මුළු ලකුණු 59 දක්වා වැඩිවී තෝරා ගත් ලේඛනයට ඇතුළත්ව ඇති බවත්. ඒ අනුව තාවකාලික ලේඛනයේ පොරොත්තුවේ සිටි අයදුම්කරුවන් තිදෙනෙක් තෝරා ගත් ලැයිස්තුවට ඇතුළත්ව ඇති අතර තෝරා ගත් ලැයිස්තුවේ සිටි තිදෙනෙක් පොරොත්තු ලේඛනයට ඇතුළත් කර ඇති බව පවසයි.

වත්මන් විදුහල්පතිවරයා තම කරුණු දැක්වීම මගින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ අදාල සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ලබාදී ඇති නිර්නායක නොසලකා හරිමින් අභියාචනා විරෝධතා මණ්ඩල මගින් ලකුණු පිරිනමා ඇති බව සහ ඒ හේතුවෙන් අයදුම්කරුවන් දෙදෙනෙකුට අගතියක් සිදුව ඇති බවත්. එම අයදුම්කරුවන් ලෙස මෙම පැමිණිලිකරුවන් අතුරින් පීපී 21 යටතේ අයදුම් කර ඇති යූ.එල්. දර්ශනී චතුරිකා සහ පීපී 95 යටතේ අයදුම් කර ඇති අයි.කේ.එස්. කරුණානායක යන අයගේ දරුවන් 2019 වසරේ තම පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් වියයුතු දරුවන් බැවින් ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව මගින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසුව අමාත්‍යාංශයේ උපදෙස් මත කටයුතු කළහැකි බව අවසන් වශයෙන් ලිඛිතව ප්‍රකාශ කර ඇත.

**නිරීක්ෂණ සහ නිගමන**

මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති ඉහත කරුණු දැක්වීම් සහ අදාල සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ලේකම් සහ අභියාචනා විරෝධතා මණ්ඩල ලේකම්වරුන් විසින් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ලිඛිත කරුණු දැක්වීම් අනුව වත්මන් විදුහල්පති ලබාදී ඇති ලිඛිත කරුණු දැක්වීම් සහ පැමිණිලිකරුවන් ඉදිරිපත් කර ඇති කරුණු දැක්වීම් සංසන්දනාත්මකව සලකා බැලීමේදී පැමිණිලිකරුවන්ට අගතියක් සිදුව ඇති බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් වත්මන් විදුහල්පති විසින් 2021-06-01 දාතමින් කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ලබාදී ඇති ලිඛිත කරුණු දැක්වීම මගින් මෙම පැමිණිලිකරුවන්ගේ දරුවන් වන දෙනෙති අමායා කරුණානායක දැරිය සහ එච්.යූ. ඔමෙත් චන්සුක යන දරුවන්ට අගතියක් සිදුව ඇති බව නිරීක්ෂණය වේ. එනම් නියමිත කඩඉම් ලකුණු සීමාවට ප්‍රවිශ්ඨ වී තිබියදී අදාල බඳවා ගැනීමේ පරිපාටියේ දක්වා ඇති ප්‍රතිපාදන උල්ලංඝණය කරමින් කටයුතු කර ඇති බව

අනාවරණය වී ඇත. ඒ අනුව යූ.එල්. දර්ශනී යන අය සහ අයි.කේ.එස්. කරුණානායක යන අය වෙත ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන පරිච්ඡේදයේ දක්වා ඇති 12(1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය**

ඉහත නිරීක්ෂණ හා නිගමන අනුව මෙම පැමිණිලිකරුවන් අතුරින් යූ.එල්. දර්ශනී චතුරිකා සහ අයි.කේ.එස්. කරුණානායක යන අයගේ දරුවන් වන දෙනෙති අමායා කරුණානායක දැරිය සහ එච්.යූ. ඔමෙත් වත්සුක යන දරුවන් හොරණ රාජකීය විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුලත් කර ගැනීම සඳහා කටයුතු කළයුතු බවට මින් නිර්දේශ කරනු ලැබේ.

2021. 12.31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරුවන් විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.

කොමසාරිස්.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

රේ/-

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි.

කොමසාරිස්.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka